15. සෝරත හිමි, කළුබෝවිටියන. **'විසි එක්වන සියවසේ අධ්‍යාපනය', ප්‍රවචන ශාස්ත්‍රීය සංග්‍රහය -** 2022* - පළමු කලාපය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය.

පර්යේෂණ පත්‍රිකා ඃ-

01 Wimalakanthi Thero, Galwewe. A Paper presented at the International Conference on Sanskrit under the topic of **''A Research on the Hostorical value of Tiriyaya Sanskrit Inscription"**

02. Uparathana Thero, Uduwila. A Paper presented at the International Conference on Sanskrit under the topic of **''An Investigation on the Methods of using Archaeological Findings to Support Sanskrit epic Tales**".

03. Nanda Thero, Gonalagoda. **"A Study of Global Political Concerns Emerging from Kautilya's Artha Shasthraya''** ''කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයෙන් මතුවන ගෝලීය දේශපාලන අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයක්'' International Conference on Sanskrit - ICS 2023, Department of Languages - Bhiksu University of Sri Lanka – Anuradhapura. (20th December 2023) ISBN 978-624-5596-05-8.

සංස්කරණ ඃ-

Nanda Thero, Gonalagoda. **Medhaṅkarābhinandana: Ven. Demalusse Medankarabhidhana - Felicitation Volume**, (Ed.) Ven. Walipitiye Pagngnaratana, Ven. Gonalagoda Nanda and Ven. Mahavatte Subodha, Abhayasinharamaya, Colombo 10, 2023, ISBN 978-624-6428-00-6

ශාස්ත්‍රීය සඟරා ඃ-

01 සෝමානන්ද හිමි, කුඩාවැවේ. (2023).**"තෙවැනි ධර්ම සංගායනාව හා ධර්මදූත මෙහෙවර"** ප්‍රසාද ශාස්ත්‍රීය සංග්‍රහය, සල්කාටෙල් ප්‍රින්ටර්ස්, මාතලේ, පිටු 99 - 113.

02 සෝමානන්ද හිමි, කුඩාවැවේ. "**A Study Freedom on Religion or Belief and Apostasy Law in Contemporary Sri Lanka"˜** මේධංකරාභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, විද්‍යාලංකාර ප්‍රින්ටර්ස්, පැලියගොඩ, පිටු 431-453.

ක්ෂේත්‍ර පර්යේෂණ ඃ-

01 Uparathana Thero, Uduwila. **"Coordinated a Prehistoric Research Excavation in Ambanpola**", Nokolagane.

02 Uparathana Thero, Uduwila. "A research paper was submitted to the refereed journal of social sciences studies under the topic of **'' A Study of Paleo and Modern Biodiversity and its usage by present day people in the area of Mahakandarawa Tank''**

03 ජිනරතන හිමි, කැලේගම. **''ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවලින් හමුවන අක්ෂර නොවන වෙනත් සංකේත පිළිබඳ විමසුමක්''**, සංස් - හෙට්ටිආරච්චි, කරුණාසේන සහ අබේනායක, ඉනෝජ් කෞශලය, ගාමිණී ශාස්ත්‍රීය සංග්‍රහය, සංදේශා ප්‍රකාශකයෝ, පාදුක්ක.

04 සුමන හිමි, වටරක්ගෙඩ. **''සරණංකර සංඝරාජ සඟ පරපුර සහ පහතරට අධ්‍යාපනික ප්‍රබෝධය'',** ප්‍රවචන, සංස්. කහටගස්දිගිලියේ ධම්මරතන හිමි සහ ගොමිල ගුණාලංකාර හිමි, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, 2022*. පිටු 138-159.

*මෙම ශාස්ත්‍රීය ග්‍රන්ථ 2023 වර්ෂයේ දී එළිදක්වා ඇත.

පර්යේෂණ පත්‍රිකා ඃ-

01. සුදත්ත හිමි, මඩුගල්ලේ. **'පිරිවෙන් ගුරුවරයාගේ වෘත්තීය තෘප්තිමත්භාවය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්'**, 16th International Conference on Pali and Buddhist Studies - 2023, University of Sri Jayawardanapura.

02. සුදත්ත හිමි, මඩුගල්ලේ. **'විසිඑක්වන සියවසේ කුසලතා අභිමුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ස්වභාවය'**, International Conference on Postgraduate Interdisciplinary Research 2023, Buddhist and Pali University of Sri Lanka.

03. සුදත්ත හිමි, මඩුගල්ලේ. **'බුදු දහමින් පිළිබිඹු වන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්'**, The International Conference on the Humanities, University of Kelaniya.

04 සුදත්ත හිමි, මඩුගල්ලේ. **'මූලික පිරිවෙන්වල සංස්කෘත භාෂාව ඉගැන්වීමේ දී ගුරුවරුන් මුහුණ දෙන ගැටලු'**, International Conference on Sanskrit 2023, Bhiksu University of Sri Lanka.

පර්යේෂණ පත්‍රිකා ඃ-

01 හේමාලෝක හිමි, මුවපැටිගේවෙල. **'ගුරුවරයාගේ ස්වභාවය ශිෂ්‍ය ඉගෙනුම් ශෛලිය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්'**, 16th International Conference on Pali and Buddhist Studies - 2023, University of Sri Jayawardanapura.

02 Soratha Thero, Kalubowitiyana. '**An Exploratory Study of Teachers Awareness of Punishment and Law**, International Conference on Postgraduate Interdisciplinary Research 2023, Buddhist and Pali University of Sri Lanka.

03 Soratha Thero, Kalubowitiyana. '**A Critical Study on the Law of Punishment Based on School Teachers'**, The International Conference on the Humanities, University of Kelaniya.

04 සෝරත හිමි, කළුබෝවිටියන. **'සංස්කෘත භාෂාව ඉගැන්වීම සඳහා තොරතුරු තාක්ෂණය යොදාගැනීම පිළිබඳ අධ්‍යයනයක්'**, International Conference on Sanskrit 2023, Bhiksu University of Sri Lanka.

<u>දේශන පැවැත්වීම</u>

01. Pagngnaloka Thero, Konakumbukwewe. A Paper presented at the International Conference on Sanskrit under the topic of "**A Study of the Evolutionary Characteristics between Nagari Scripts I and Ī Using Inscriptions from India and Sri Lanka**"

5.2 අධ්‍යයන පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු.

2023 වර්ෂයේ දී මෙම විශ්වවිද්‍යාලය විසින් පවත්වන ලද අධ්‍යයන පාඨමාලා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ විස්තර පහත දැක්වේ.

	අධ්‍යයන පාඨමාලා / සම්මන්ත්‍රණ/ වැඩමුළු	සංඛ්‍යාව
1	උපාධි පාඨමාලා	08
2	පශ්චාද් උපාධි පාඨමාලා	02
3	සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලා	05
4	වැඩමුළු	02



International Conference on Sanskrit (ICS - 2023)

5.2.1 උපාධි පාඨමාලා

i. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය)
ii. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) (බාහිර උපාධි පාඨමාලාව)
iii. ශාස්ත්‍රවේදී (ගෞරව) - බෞද්ධ දර්ශනය
iv. ශාස්ත්‍රවේදී (ගෞරව) - බෞද්ධ ශිෂ්ටාචාරය
v. ශාස්ත්‍රවේදී (ගෞරව) - පාලි
vi. ශාස්ත්‍රවේදී (ගෞරව) - පුරාවිද්‍යාව
vii. ශාස්ත්‍රවේදී (ගෞරව) - සංස්කෘත
viii. ශාස්ත්‍රවේදී (ගෞරව) - බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය
ix. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)

5.2.2 පශ්චාද් උපාධි පාඨමාලා

i. දර්ශනපති - MPhil
ii. දර්ශන විශාරද - PhD

5.2.3 සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලා

i. ඉංග්‍රීසි භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
ii. දෙමළ භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
iii. ජපන් භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
iv. චීන භාෂා සහතික පත්‍ර (අභ්‍යන්තර) පාඨමාලාව
v. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව
vi. බෞද්ධ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව (බාහිර)
vii. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (බාහිර)
viii. දෙමළ භාෂාව ඩිප්ලෝමා පාඨමාලාව (බාහිර)
ix. ජ්‍යොතිෂ්‍ය උසස් සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)
x. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)
xi. දෙමළ භාෂාව සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)
xii. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)
xiii. ජ්‍යොතිෂ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (බාහිර)
xiv. ජපන් භාෂා සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)
xv. චීන භාෂා උසස් සහතික පත්‍ර පාඨමාලාව (බාහිර)



8 වන උපාධි ප්‍රදානෝත්සවය සහ 3 වන උපාධි ප්‍රදානෝත්සවය (බාහිර)

6. පුස්තකාලයීය කාර්ය සාධනය

6.1 පුස්තකාලය සතු ග්‍රන්ථ සංචිතය (2023.12.31 දිනට)

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පුස්තකාලය සතු ග්‍රන්ථ 59,662 ක් වේ. ඒවා පාඨකයින්ගේ පරිහරණයට පහසුවන සේ පහත සඳහන් පරිදි වර්ගීකරණය කර ඇත.

පුස්තකාලයීය ග්‍රන්ථ වර්ගීකරණය - ඩිවි දශම වර්ගීකරණය 21
(Dewey Decimal Classification - 21)

000 - සාමාන්‍ය කෘති	- General Works
100 - දර්ශනය සහ මනෝවිද්‍යාව	- Philosophy & Psychology
200 - ආගම	- Religion
300 - සමාජ ශාස්ත්‍ර	- Social Sciences
400 - භාෂාව	- Language
500 - ස්වභාව විද්‍යා සහ ගණිතය	- Science
600 - තාක්ෂණ විද්‍යා (ව්‍යවහාර විද්‍යා)	- Technology
700 - කලා හා ලලිත කලා	- Arts & Recreation
800 - සාහිත්‍යය	- Literature
900 - භූගෝල විද්‍යාව සහ ඉතිහාසය	- History & Geography 58138.85

6.2 විඥාපන සම්පත් අත්පත් කර ගැනීම - 2023

අනු අංකය	වර්ගය	ප්‍රමාණය	වටිනාකම (රු.)
1	මිලදී ගත් ග්‍රන්ථ ප්‍රමාණය	912	470,631.00
2	අතත්‍ය බිත්ති පුස්තකාල පුවරුව	01	145,000.00
3	පරිත්‍යාග ලත් ග්‍රන්ථ	188	161,865.25
4	ශාස්ත්‍රීය සඟරා	63	58,138.20
5	පරිත්‍යාග - පුස්තිකා	09	2,460.65

❖ **ග්‍රන්ථ සංරක්ෂණය සඳහා සිදුකරන ලද පොත් බැඳීම් - 72**

6.3 පුස්තකාල සාමාජිකත්වය - 2023

කාණ්ඩය	ලියාපදිංචි කළ සාමාජිකයින් සංඛ්‍යාව	සමස්ත සාමාජික සංඛ්‍යාව
අභ්‍යන්තර ශිෂ්‍ය හිමිවරුන්	143	442
අධ්‍යයන කාර්ය මණ්ඩලය	05	62
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	02	83
බාහිර පාඨමාලා සාමාජිකයින්	02	101
එකතුව	**152**	**690**

6.4 පාඨකයින් සඳහා පුස්තකාලයෙන් නිකුත් කරන ලද පොත් සංඛ්‍යාව

	2022 වර්ෂය	2023 වර්ෂය
නිකුත් කළ පොත් ප්‍රමාණය	11,890	31,706



පුස්තකාලය

7. මූල්‍ය කාර්ය සාධනය

7.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

රුපියල් මිලියන

	විෂය	2022	2023
1	පුද්ගල වැටුප් හා දීමනා	308.08	320.68
2	දේශීය/විදේශීය ගමන් වියදම්	4.21	6.26
3	සැපයුම්	11.47	14.90
4	නඩත්තු	9.28	11.46
5	ගිවිසුම්ගත සේවා	42.13	62.73
6	වෙනත්	27.84	27.93
	එකතුව	**403.01**	**443.96**

7.2 ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

රුපියල් මිලියන

	විෂය	2022	2023
1	ලී බඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීම	7.8	8.4
2	යන්ත්‍ර මිලදී ගැනීම්	-	5.58
3	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	11.5	24.9
4	වෙනත් (ගොඩනැගිලි සහ පුනරුත්ථාපන)	1.6	-
5	පොත් මිලදී ගැනීම	0.4	0.6
6	ඉඩම් හා ඉඩම් සංවර්ධන	-	0.7
7	හැකියා වර්ධනය	0.08	0.04
8	පර්යේෂණ වැඩමුළු වියදම්	1.73	3.88
	එකතුව	**23.11**	**44.10**

7.3 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත)

රුපියල් මිලියන

	ව්‍යාපෘතිය	අරමුදල් සම්පාදන ආයතනය	මුළු පිරිවැය ඇස්තමේන්තුව
1	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය නව පරිශ්‍රයක පිහිටුවීමේ ව්‍යාපෘති අදියර I	ශ්‍රී ලංකා රජය	1,300
2	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය නව පරිශ්‍රයක පිහිටුවීමේ ව්‍යාපෘති අදියර II	ශ්‍රී ලංකා රජය	900
	එකතුව		2,200

7.4 ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත)

රුපියල් මිලියන

	ව්‍යාපෘතිය	මුළු පිරිවැය ඇස්තමේන්තුව	2022 වියදම	2023 වියදම	2023.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය ٪
	ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය පිහිටුවීමේ ව්‍යාපෘති අදියර I හා II	2,200	11.5	34.51	2,106.98	79.41%

7.5 යටිතල පහසුකම් පිළිබඳ විස්තර

7.5.1 යටිතල පහසුකම් පිළිබඳ විස්තර - මූලධන ව්‍යාපෘති

රුපියල් මිලියන

	ව්‍යාපෘතිය	වැඩ අවසන් කිරීමේ දිනය	මුළු පිරිවැය ඇස්තමේන්තුව	2023 වියදම	2023.12.31 දිනට සමුච්චිත වියදම	භෞතික ප්‍රගතිය ٪
1	විදේශීය ශිෂ්‍ය නේවාසිකාගාරය (කාමර 25)	2020.01.13	104	0.523	81.366	100%
2	මහෝපාධ්‍යායය නිලනිවාසය, පීඨාධිපති නේවාසිකාගාරය, අංශාධිපති නේවාසිකාගාරය, පරිපාලන නිලධාරි නේවාසිකාගාරය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය නේවාසිකාගාරය	2021.03.08	255	4.419	180.723	100%
3	බහුකාර්ය ගොඩනැගිල්ල	2024.09.30 (දීර්ඝ කළ)	486	20.162	198.216	38.25%
	එකතුව		845	25.105	460.305	

7.5.2 යටිතල පහසුකම් පිළිබඳ විස්තර - පුනරුත්ථාපන ව්‍යාපෘති

	විෂය	2022 වියදම (රු)	2023 වියදම (රු)
1	පුනරුත්ථාපන ව්‍යාපෘති	1,323,066.90	9,371,611.86
2	උපදේශන සේවා ගාස්තු	-	-
3	රැඳවුම් මුදල් නිදහස් කිරීම	489,288.12	33,507.43
4	තාක්ෂණික ඇගයීම් කමිටු සඳහා ගෙවීම	-	5,000.00

7.6 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්)

රුපියල්

	විෂය	2021		2022		
		ලැබීම්	වියදම	ලැබීම්	වියදම	ඉතිරිය/ අතිරික්තය
1	ව්‍යාපෘති නොවන පුනරුත්ථාපන	341,400,000	347,391,510	395,200,000	403,009,151	(7,809,151)
2	ව්‍යාපෘති නොවන මූලධන	6,154,000	6,154,009	11,609,042	11,609,042	-
3	ව්‍යාපෘති - දේශීය අරමුදල්	125,846,000	125,846,000	11,500,958	11,500,958	-

7.7 මූල්‍ය කාර්යය සාධන විශ්ලේෂණය - 2023

රුපියල්

	විෂය	2022	2023
1	ඒක ශිෂ්‍ය පිරිවැය - පුනරාවර්තන වියදම අනුව	870,430	1,013,602
2	ඒක ශිෂ්‍ය පිරිවැය - මූලධන වියදම අනුව	49,914	100,683
	එකතුව	**920,344**	**1,114,285**

8.1 ධරණීය (තිරසර) සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව.

පරිසරය හා ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම බෞද්ධ දර්ශනයේ මූලික පරමාර්ථයකි. ඒ අනුව මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරමාර්ථය බෞද්ධ දර්ශනය හා ඒ හා ආනුෂංගික ක්‍රියාකාරකම් සමග සෘජුවම බැඳී ඇති බැවින් විශ්වවිද්‍යාලය මගින් සිදුකරනු ලබන සෑම ක්‍රියාකාරකමක් ම පරිසරය ආරක්ෂා කරමින් තිරසර සංවර්ධනයක් කරා ගමන් කිරීමට පහසුවන සේ සකස් කර ඇත.

ධරණීය (තිරසර) සංවර්ධනය මත පදනම්ව විශ්වවිද්‍යාලය විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම්

1. 2018 වර්ෂයේ දී ආරම්භ කරන ලද සූර්ය බල විදුලි පද්ධතිය (100KW) හා සූර්ය බල වීදී පහන් කණු පද්ධතිය (පහන් 70ක් සහිත) මගින් මේ වන විට විශ්වවිද්‍යාලයේ මාසික විදුලි අවශ්‍යතාවයෙන් 30% ආසන්න ප්‍රතිශතයක් සපුරා ගනු ලැබේ. ලැබෙන ප්‍රසම්පාදන ප්‍රතිපාදන මත මෙය ඉදිරියේ දී 100% දක්වා වැඩිකර ගැනීමට අපේක්ෂා කෙරේ.

2. විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සහභාගීත්වයෙන් ප්‍රදේශයේ පාරිසරික සාධකයන්ට ඔරොත්තු දෙන ඖෂධ වර්ග, පළතුරු හා වෙනත් දුර්ලභ ශාඛ රෝපණය කොට පවත්වාගෙන යාමේ ව්‍යාපෘතියක් වාර්ෂිකව සිදුකරමින් පවති.

3. විශ්වවිද්‍යාලය විසින් දෛනිකව බැහැරකරනු ලබන දිරාපත්වන කසළ භාවිතයෙන් කාබනික පොහොර (කොම්පෝස්ට්) නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

4. පරිසර හානිය වලක්වා ගැනීම පිණිස විශ්වවිද්‍යාලයෙන් වාර්ෂිකව ඉවත්කරනු ලබන පුවත්පත්, සඟරා, ලිපිද්‍රව්‍ය ආදිය ප්‍රතිචක්‍රීයකරණය සඳහා යොමු කෙරේ.

5. විශ්වවිද්‍යාලයේ මානමුනාවත්ත පරිශ්‍රයේ හා තිසාවැවවත්ත පරිශ්‍රයේ මළ අපද්‍රව්‍ය පිරිපහදු පද්ධති දෙකක් සවිකර එමගින් පිටවන ජලය විශ්වවිද්‍යාලයේ පරිසර සංවර්ධනය සඳහා යොදනු ලැබේ.

6. විශ්වවිද්‍යාලය මගින් වාර්ෂිකව බැහැර කරනු ලබන අබලි භාණ්ඩ රජයේ වෙනත් ආයතනවල නැවත ප්‍රයෝජනය සඳහා පරිත්‍යාග කරනු ලැබේ.

7. විශ්වවිද්‍යාලය සතු සම්පත් උපරිම ආකාරයෙන් ප්‍රයෝජනයට ගත හැකිවන පරිදි නිසි ක්‍රමවේද සකස් කරමින් පවතී. ඒ යටතේ දැනටමත් විශ්වවිද්‍යාලය තුළ හරිත සංකල්පය ක්‍රියාත්මක කෙරේ.

8. කඩදාසි භාවිතය අවම කිරීම සඳහා මෙම විශ්වවිද්‍යාලය මගින් අන්තර්ජාල සන්නිවේදන ක්‍රම වැඩි වශයෙන් භාවිත කරනු ලැබේ.

9. පරිසර හිතකාමී ලෙස සිවුරු පිරිකර බැහැර කිරීම.



2023 විගණකාධිපති වාර්තාව හා පිළිතුරු

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

අනුරාධපුරය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. NCCG/AN/D/BUSL/23/FA/17 මගේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2024 මැයි 31 දින

මහෝපාධ්‍යයන් වහන්සේ,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,
අනුරාධපුර.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත්, මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන

සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) හා 38(2)	එක් එක් අස්ථිත්‍වයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කළින් කළ ලිඛිතව සමාලෝචනය සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.8 වගන්තිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2019 නොවැම්බර් 25 දිනැති අංක 109/2019 දරන ආයතනික වක්‍රලේඛයෙහි (Establishment circular) 3(ii) ඡේදය	නිල නිවාසලාභීන් විසින් ජලය හා විදුලි වියදම් දැරිය යුතු වුවත්, 2023 වර්ෂය තුළදී නිල නිවාසවල ජලය හා විදුලිය වෙනුවෙන් එකතුව රු.13,762,115 ක් විශ්වවිද්‍යාල අරමුදලින් වැය කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් විගණන නිරීක්ෂණය

(අ) වටිනාකම රු.මිලියන 8 ක් වූ සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතිය (Enterprise Resource Planning) ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව, ගිවිසුම් ප්‍රකාරව 2018 මැයි 31 දින වන විට අවසන් කළ යුතු වුවද, විගණිත දින වූ 2024 අප්‍රේල් 01 වන විට රු.මිලියන 4ක් වැයකර ඇතත්, පද්ධතිය නිසි ක්‍රියාකාරීත්වයකින් ස්ථාපනය කිරීමට අපොහොසත් වී තිබුණි. තවද ලංසු ලියකියවිලිවලට අනුව ජයග්‍රාහී ලංසුකරු අදාල ක්ෂේත්‍රයෙහි අවසාන වර්ෂ තුනෙහි වාර්ෂික පිරිවැටුම රු.මිලියන 50 ක් ඉක්මවා තිබිය යුතු වුවද, එම අවශ්‍යතාවය සපුරා නොතිබුණු ලංසුකරුවෙකු තෝරා ගෙන තිබුණි. ඒ අනුව මෘදුකාංග පද්ධතිය ස්ථාපනය කිරීමට වැය කර තිබූ රු.මිලියන4 ක මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

(ආ) ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීමෙන් තොරව විදේශීය පැවිදි සිසුන් 25 දෙනෙකු සඳහා රු.80,843,406ක් වැයකර ඉදිකරන ලද නේවාසිකාගාරයේ වැඩ 2020 ජනවාරි 14 දින නිම කර තිබුණ ද උපාධි පාඨමාලා සඳහා විදේශීය ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා බඳවා ගැනීමට නිසි වැඩපිළිවෙලක් විශ්වවිද්‍යාලය විසින් සකස් කර ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය අපොහොසත්වී තිබුණි. එබැවින් ඉදිකරන ලද රු.80,843,406ක් වටිනාකමැති නේවාසිකාගාරය සහ එම ගොඩනැඟිල්ලට සවිකර තිබූ රු.3,411,000 ක විදුලි හා සවිකිරීම් වසර 04 කට වඩා කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට අදාළව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

විගණකාධිපති වාර්තාවේ ඡේද අංකය	විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු		ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග
1. මූල්‍ය ප්‍රකාශන	**1.1.** මතය	සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව විගණකාධිපති විසින් දරන මතය වේ.	
2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව	2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඇ) හා 38 (2) වගන්ති	(අ) එක් එක් අස්ථිත්වයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර එහි ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඇ) හා 38 (2) වගන්ති වලින් මූල්‍ය පාලනයට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමය සමාලෝචන කළ යුතු බව දක්වා ඇත. විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනයට අදාල අභ්‍යන්තර පාලන ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා දැනටමත් මූදල් රෙගුලාසි 135 අනුව වාර්ෂික මූල්‍ය බලතල පැවරීම, මූදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම, මුදල් කමිටුව හරහා අයවැය, ආයෝජන හා අනෙකුත් මූල්‍ය තීරණ ගැනීම, ප්‍රසම්පාදන හා වියදම් පාලන කමිටු පිහිටු වීම, අභ්‍යන්තර විගණක විසින් කොන්ත්‍රාත් ගෙවීම්, අර්ථසාධක අරමුදල්/ පාරිතෝෂික නිදහස් කිරීම්, උසස්වීම් සහ වැටුප් වර්ධකයන්ට අදාළව හිඟ වැටුප් ගෙවීම් පූර්ව විගණනය කිරීම ආදිය සිදු කර ඇත. විගණන පනත මගින් දක්වා ඇති මූල්‍ය පාලනය සමාලෝචනය සිදු කිරීමට අදාළ ආකෘතියක් හඳුන්වා දී චක්‍රලේඛයක් නිකුත් කර නොමැත. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති ආකෘතිය අනුව කාර්තුමය වශයෙන් විශ්වවිද්‍යාලයේ මූල්‍ය පාලනයට අදාළ කටයුතුවල සමාලෝචනයක් සිදු කරනු ලැබේ. එහි පිටපත් විශ්වවිද්‍යාලයේ විගණන හා කළමනාකරණ කමිටුවට සහ රජයේ විගණක වෙත ලබා දී ඇත. මෙම කාර්තු ඇගයීම් වාර්තා තුළ මූල්‍ය පාලනයට අදාළ පහත සඳහන් කරුණු ඇතුළත් වේ. • වාර්ෂික මූල්‍ය ප්‍රකාශ නියමිත පරිදි ඉදිරිපත් කිරීම. • වාර්ෂික වත්කම් සමීක්ෂණ කටයුතු නියමිත පරිදි ඉටු කිරීම. • අත්තිකාරම් ගිණුම් නියමිත පරිදි සකස් කිරීම. • මාසික බැංකු සැසඳුම් නියමිත පරිදි සකස් කිරීම. • ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන වීම. • වැටුප් ලේඛනය යාවත්කාලීන වීම. • තැම්පත් ලේඛනය යාවත්කාලීන වීම. • හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන වීම. • ණයගැති හා ණයහිමි ලේඛන යාවත්කාලීන වීම. • පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රගතිය මූල්‍ය පාලනයට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමවල ශක්තිමත් බව ඉහත

විගණකාධිපති වාර්තාවේ ඡේද අංකය	විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු		ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග
			සඳහන් කරුණු තුළින් සමාලෝචනය කර ගත හැකිය. වාර්ෂික අනුමත විගණන සැලැස්ම අනුව විගණන ක්ෂේත්‍ර වලට අදාළව අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය කරනු ලැබේ. තවද ඉහත සඳහන් ඇගයීමට අමතරව විශ්වවිද්‍යාලයේ සියලුම අධ්‍යයන හා අනධ්‍යයන අංශවල වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සම්බන්ධයෙන් කාර්තුමය වශයෙන් විශ්වවිද්‍යාලයේ විගණන හා කළමනාකරණ කමිටුවේදී සමාලෝචනය කරනු ලැබේ. ඒ අනුව මූල්‍ය පාලනයට අදාළ අභ්‍යන්තර පාලන ක්‍රමය සමාලෝචනය කර නොමැත යන්න පිළිගත නොහැකි අතර දැනට විගණනය වෙත ලබාදෙන ආකෘතිය සංශෝධනය සිදුවිය යුතු නම් ඒ සඳහා මාර්ගෝපදේශයක් අපේක්ෂා කෙරේ.
	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.8 වගන්තිය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන ආයතනික චක්‍රලේඛයෙහි 3 (ii) ඡේදය	(ආ) නිල නිවාසලාභීන් විසින් ජලය හා විදුලි වියදම් දැරිය යුතු වූවත්, 2023 වර්ෂය තුලදී නිල නිවාසවල ජලය හා විදුලිය වෙනුවෙන් එකතුව රු. 13,762,115 ක් විශ්වවිද්‍යාල අරමුදලින් වැය කර තිබුණි.	මෙම විශ්වවිද්‍යාලයේ නවාතැන් පහසුකම් සඳහා යොදාගෙන ඇති ගොඩනැගිලි පිහිටා ඇති ප්‍රධාන පරිශ්‍රයන් සඳහා පොදුවේ ජල හා විදුලි සම්බන්ධතාවයන් ලබා ගෙන ඇති අතර ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලාට ලබා දී ඇති නේවාසිකාගාර හා අනෙකුත් ශිෂ්‍ය පොදු පහසුකම් සහිත ගොඩනැගිලි ද උද්‍යාන නඩත්තු කටයුතු, ආරක්ෂක කටයුතු හා විශ්වවිද්‍යාලයේ සියලු පරිපාලන කටයුතු සඳහාත් එම ජල හා විදුලි සැපයුම් පොදුවේ භාවිතයට ගන්නා බැවින් නේවාසිකාගාර පහසුකම් ලබා දීමේදී නේවාසිකාගාර යටතේ පවතින ජල හා විදුලි වියදම වෙන වෙනම නිශ්චය කර ගත නොහැක.
	2.3 වෙනත් විගණන නිරීක්ෂණයන්	(අ) වටිනාකම රු. මිලියන 08 ක් වූ සම්පත් කළමනාකරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ පද්ධතිය (Enterprise Resource Planning) ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව, ගිවිසුම් ප්‍රකාරව 2018 මැයි 31 දින වන විට අවසන් කළයුතු වූවද, විගණිත දින වූ 2024 අප්‍රේල් 01 වන විට රු. මිලියන 4 ක් වැයකර ඇතත්, පද්ධතිය නිසි ක්‍රියාකාරීත්වයකින් ස්ථාපනය කිරීමට අපොහොසත් වී තිබුණි. තවද ලංසු ලියකියවිලිවලට අනුව ජයග්‍රාහී ලංසුකරු	මේවන විට විශ්වවිද්‍යාලයේ සියලු අංශයන් විසින් ERP පද්ධතිය පරීක්ෂණ මට්ටමින් (Test Run) ක්‍රියාත්මක කරනු ලබයි. පද්ධතිය ධාවනයේදී මතුවන ගැටලු අදාළ ආයතනය මගින් නිවැරදි කරමින් මාස 06 ක කාලයක් සඳහා ක්‍රියාත්මක කරමින් පවති. මෙම පරීක්ෂණ ධාවනයන් 2024.04.30 දිනෙන් අවසන් කර 2024.05.01 දින සිට පද්ධතිය විශ්වවිද්‍යාලය වෙත භාරදීමට, 2024.03.21 දින විශ්වවිද්‍යාලය හා නියෝජිත ආයතනය සමඟ පැවති සාකච්ඡාවේදී හා පුහුණු වැඩමුළුවේදී නියෝජිත ආයතනය එකඟ වී ඇත. ERP පද්ධතියෙහි පවතින ගැටළු සම්බන්ධයෙන් ස්වාධීන තෙවන පාර්ශවයකගේ උපදේශකත්වය ලබාගැනීම සඳහා ජාතික විද්‍යා පදනමේ ප්‍රධාන තොරතුරු නිලධාරී මනුජ කරුණාරත්න මහතාගේ සහය ලබාගැනීමට මේවන විට කටයුතු කර ඇත. ඒ මහතා විසින් මේවන විට විශ්වවිද්‍යාලය විසින් අපේක්ෂිත

විගණකාධිපති වාර්තාවේ ඡේද අංකය	විගණකාධිපති විසින් විමසීම් කරන ලද කරුණු		ඒ සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග
		අදාල ක්ෂේත්‍රයෙහි අවසාන වර්ෂ තුනෙහි වාර්ෂික පිරිවැටුම රු. මිලියන 50 ක් ඉක්මවා තිබිය යුතු වූවද, එම අවශ්‍යතාවය සපුරා නොතිබුණු ලංසුකරුවෙකු තෝරා ගෙන තිබුණි. ඒ අනුව මෘදුකාංග පද්ධතිය සිථාපනය කිරීමට වැයකර තිබූ රු. මිලියන 04 ක මුදල නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.	පහසුකම් දැනට භාවිත ERP පද්ධතියෙහි අන්තර්ගත වී ඇත්ද යන්න පිළිබඳව විමර්ෂණය කර බලා වාර්තාවක් ලබාදීමට නියමිතව ඇත.
		(ආ) ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමෙන් තොරව විදේශීය පැවිදි සිසුන් 25 දෙනෙකු සඳහා රු. 80,843,406 ක් වැයකර ඉදිකරන ලද නෝවාසිකාගාරයේ වැඩ 2020 ජනවාරි 14 දින නිම කර තිබුණද උපාධි පාඨමාලා සඳහා විදේශීය ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා බඳවා ගැනීමට නිසි වැඩපිළිවෙලක් විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. එබැවින් ඉදිකරන ලද රු. 80,843,406 ක් වටිනාකමැති නේවාසිකාගාරය සහ එම ගොඩනැගිල්ලට සවිකර තිබූ රු. 3,411,000 ක විදුලි හා සවිකිරීම් වසර 04 කට වඩා කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.	2021/2022 අධ්‍යයන වර්ෂයට විදේශ සිසුන් බඳවා ගැනීමේ වැඩසටහන යටතේ තානාපති කාර්යාල විද්‍යුත් තැපෑල මගින් දැනුවත් කරන ලදි. ඒ අනුව විදේශීය ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා තිදෙනෙක් අයදුම්පත් ඉදිරිපත් කර තිබූ අතර සුදුසුකම් සපුරා ඇති ස්වාමීන් වහන්සේලා දෙදෙනෙක් මෙම අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි කර ඇති අතර මේවන විට එක් විදේශීය ශිෂ්‍ය ස්වාමීන් වහන්සේ නමක් අධ්‍යයන කටයුතුවල නිරත වේ. විදේශ සිසුන් උපාධි වැඩසටහන් සඳහා යොමු කරන්නේ වර්ෂයක පදනම් පාඨමාලාවක් අවසන් කළ පසු වේ. ඒ අනුව වර්ෂ 03 ක උපාධි පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වන විදේශ ශිෂ්‍යයෙකු වර්ෂ 04 ක කාලයක් නේවාසිකව සිටිය යුතු වේ. වර්ෂ 04 ක උපාධි පාඨමාලාවක් සඳහා වර්ෂ 05 ක් සිටිය යුතු වේ. ඒ අනුව වර්ෂ 05ක ශිෂ්‍යයන් නේවාසිකාගාරයේ සිටින විට එක් වර්ෂයක් සඳහා බඳවා ගත හැක්කේ උපරිම ශිෂ්‍යයින් 05 ක් පමණි.

මෙයට,

ශාසනාලයැති,

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කනත්තෙගොඩ සද්ධාරතන අනුනායක ස්ථවිර
මහෝපාධ්‍යායයන් වහන්සේ
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
අනුරාධපුර
ශ්‍රී ලංකාව

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පූජ්‍ය කනත්තෙගොඩ සද්ධාරතන අනුනායක ස්ථවිර,

මහෝපාධ්‍යායයන් වහන්සේ.



වාර්ෂික මූල්‍ය ප්‍රකාශය

2023

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

අනුරාධපුරය.

2023 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ
වාර්ෂික මූල්‍ය ප්‍රකාශ සඳහා වූ ව්‍යවස්ථාපිත වාර්තාව

01. 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල සංශෝධිත පනතේ 46 වගන්ති ප්‍රකාරව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ වගන්ති ප්‍රකාරව 2023 වර්ෂයේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ගිණුම් වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

02. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPAS) අනුකූලව කටයුතු කර ඇති අතර විශේෂයෙන්ම සඳහන්කර ඇති අවස්ථාවල හැර පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම සහ ප්‍රතිපත්ති ජංගම වර්ෂයේ දීත් නොවෙනස්ව අනුගමනය කර ඇත.

03. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයයේ 2023 වර්ෂයේ ගිණුම් වාර්තාවෙන් පැහැදිලිවන පහත සඳහන් සටහන් උපුටා දක්වනු ලැබේ.

i. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයට පුනරාවර්තන සහ මූලධන ආධාර වශයෙන් රජයෙන් රු.418,310,000/= ක මුදලක් පහත සඳහන් පරිදි ලැබී ඇත.

පුනරාවර්තන	රු.423,140,000
මූලධන වත්කම් පුනරුත්ථාපන	රු.170,014,000
	රු. 593,154,000

ii. වර්ෂය තුළ මෙහෙයුම් වියදම්වල එකතුව මිලියන 593.78කි. මෙය මූලික වශයෙන් පුද්ගල පඩිනඩි හා විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් වන අතර එම මුදල මිලියන 320.68 කි.

iii. පවත්නා වර්ෂයේ මෙහෙයුම් ඌනතාවක් වාර්තා වන අතර එය රු. මිලියන 92.98 කි.

iv. වාර්තා කරනු ලබන දින වන විට දේපල,පිරියත හා උපකරණවල ශුද්ධ පොත් අගය රු. මිලියන 1,599.18 වේ. ඒවායේ සංචලනය සම්බන්ධ විස්තර මූල්‍ය ප්‍රකාශනයන් සඳහා වන සටහන 2හි දක්වා ඇත.

v. වාර්තා කරනු ලබන දින වන විට නොනිමි වැඩවල අගය රු. මිලියන 188.33කි. මෙම ශේෂය මූලික වශයෙන් ඉදිවෙමින් පවතින බහුකාර්ය ගොඩනැගිල්ලි සඳහා ඉදිවන නිවාස වෙනුවෙන් දැරූ මුදල් වේ.

vi. ප්‍රවර්තන වර්ෂය තුල කාර්යාල උපකරණ, ඉගැන්වීම් උපකරණ, අභ්‍යන්තර දුරකථන පද්ධතිය, පරිගණක මෘදුකාංග, පරිගණක දෘඩාංග සහ විවිධ උපකරණ ප්‍රත්‍යාගණනය කර ඇත.

vii. විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ස්වාමීන් වහන්සේලා අභ්‍යන්තර විභාගවලදී දක්වන සමත්කම් ඇගයීම සඳහා ත්‍යාග ලබාදෙන අතර ඒ සඳහා ත්‍යාග අරමුදල් පිහිටුවා ඇත. වාර්තා කරනු ලබන දිනට මෙහි අගය රු.මිලියන 5.5 වේ. මේ සම්බන්ධ විස්තර මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 12.1 දක්වා ඇත.

04. 1996 අංක 26 දරන බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල සංශෝධිත පනතේ අංක 30 වගන්තියට අනුව සේවක අර්ථසාධක අරමුදල විශ්වවිද්‍යාලය විසින් පවත්වා ගෙන යනු ලැබේ. ඒ සඳහා වන ගිණුම් වාර්තා වෙනමම පිළියෙල කරනු ලබන අතර එම වාර්තාව මෙම ගිණුම් සමග ඇතුළත් කර ඉදිරිපත් කර ඇත. වාර්තා කරනු ලබන දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂය රු. මිලියන 479.59 වන අතර එම මුදල් ස්ථාවර තැන්පතුවල, භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇති අතර සාමාජිකයන් හට ණය ලබාදීම්ද කර ඇත. වර්ෂය තුළ සාමාජිකයන්ගේ දායක මුදල් වශයෙන් රු. මිලියන 51.24 ක මුදලක් ලැබී ඇත.

05. පුනරාවර්තන වැය ශීර්ෂයන්හි සත්‍ය වියදම් සහ අයවැය වෙන්කිරීම් අතර විචල්‍යයන්, පාලක සභාවේ අනුමැතිය ඇතිව, ප්‍රතිපාදන ගළපා තුලනය කර ඇත.

.....
ආචාර්ය පූජ්‍ය කඩවත්ගම පියරතන ස්ථවිර
වැ.බ. මහෝපාධ්‍යායයන් වහන්සේ

දෙසැම්බර් 31 වන දිනට	පිටු අංකය	සටහන්	2023 (රු.)	2022.12.31 නැවත ප්‍රකාශිත (රු.)	2022.01.01 නැවත ප්‍රකාශිත (රු.)
වත්කම්					
ජංගම නොවන වත්කම්					
දේපළ, පිරියත හා උපකරණ	13	2	1,599,183,012	1,679,408,664	1,722,676,775
අයිතිවාසිකම් වත්කම්	14	3	173,583	-	-
නොනිමි වැඩ	15	4	188,330,649	182,689,767	163,704,136
ආයෝජන	15-16	5	30,230,658	26,048,936	22,677,779
ලැබිය යුතු ණය	16	8	10,708,631	10,168,898	9,758,938
සේවක අර්ථසාධක අරමුදල් ආයෝජන හිඟුම	43-50	37	479,585,436	400,952,320	327,180,376
			2,308,211,969	**2,299,268,585**	**2,245,998,004**
ජංගම වත්කම්					
තොගය	16	6	7,586,890	6,883,203	2,897,449
අත්කිකාරම් සහ තැන්පතු	16	7	35,769,546	44,109,715	54,843,564
ලැබිය යුතු ණය	16-17	8	15,703,355	14,056,082	7,921,969
ඉදිරියට කළ ගෙවීම්	17	9	725,643	865,866	981,474
කෙටිකාලීන ආයෝජන	15	5.1	54,829,392	51,245,133	37,759,882
බැංකුවෙහි ඇති මුදල්	18	10	133,035,350	5,474,925	8,028,911
			247,650,176	**122,634,924**	**112,433,249**
මුළු වත්කම්			**2,555,862,145**	**2,421,903,509**	**2,358,431,253**
හිමිකම් සහ වගකීම්					
සංචිත					
ප්‍රාග්ධන සංචිතය	6	-	1,525,341	1,525,341	1,525,341
වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය	6	-	122,518,828	98,866,429	28,507,469
පොදු සංචිතය	6	-	1,606,793,963	1,689,622,091	1,785,850,513
ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ සංචිතය	18	11	12,850,394	11,168,909	9,232,925
වැය නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන			125,914,798		
			1,869,603,324	**1,801,182,770**	**1,825,116,248**
ජංගම නොවන වගකීම්					
සේවක අර්ථසාධක අරමුදල්	43-50	37	479,585,436	400,952,320	327,180,376
ත්‍යාග හා අනෙකුත් අරමුදල්	19-20	12	45,291,163	40,499,895	36,452,196
පාරිතෝෂික වෙන් කිරීම්	20	13	94,591,669	89,659,843	87,060,297
			619,468,268	**531,112,058**	**450,692,869**
ජංගම වගකීම්					
ගෙවිය යුතු පාරිතෝෂික	20	13	-	7,651,455	3,934,711
ත්‍යාග හා අනෙකුත් අරමුදල්	19-20	12	-	1,706,960	-
විවිධ ණය හිමියෝ	21	14	2,466,604	13,666,901	14,041,278
නොනිමි බාහිර /අභ්‍යන්තර පාඨමාලා	21-27	15	30,445,309	27,947,985	20,638,247
රැඳවුම් හා ඇප තැන්පතු	28	16	21,387,184	22,953,625	29,673,109
උපචිත වියදම්	29	17	12,491,456	15,681,755	14,334,791
			66,790,553	**89,608,681**	**82,622,136**
මුළු හිමිකම් සහ වගකීම්			**2,555,862,145**	**2,421,903,509**	**2,358,431,253**

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය අංශ හිඟුම්කරණ ප්‍රමිතවලට අනුව සකස් කර ඉදිරිපත් කර ඇත.

.....

ජී.ආර්. තුෂාන් අනුරුද්ධ
මූල්‍යාධිකාරී

පිටු අංක 7 සිට 50 දක්වා ඇති හිඟුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම කොටසකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ වගකීමයි. මෙම හිඟුම් ප්‍රකාශ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කර ඇති අතර පාලක සභාව වෙනුවෙන් අප විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අත්සන් කරන ලදි.

.....	.....	.....	.....
ඒ.ඩී.කිත්සිරි	ආචාර්ය පූජ්‍ය කඩවත්ගම පියරතන ස්ථවිර	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පූජ්‍ය කිරම විමලතිස්ස ස්ථවිර	මහාචාර්ය බී.ඒ. කරුණාරත්න
ලේඛකාධිකාරී	වැ.බ. මහෝපාධ්‍යායයන් වහන්සේ	පාලක සභා සාමාජික	පාලක සභා සාමාජික

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

මූල්‍ය ක්‍රියාකාරිත්ව ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය	පිටු අංකය	සටහන්	2023 (රු.)	2022 නැවත ප්‍රකාශිත (රු.)
භාණ්ඩාගාර ප්‍රතිපාදන				
පුනරාවර්තන ප්‍රතිපාදන			423,140,000	395,200,000
භාණ්ඩාගාර ප්‍රතිපාදන -පුනරුත්ථාපන			7,827,924	1,552,058
භාණ්ඩාගාර ප්‍රතිපාදන -හැකියා වර්ධනය			40,000	80,000
භාණ්ඩාගාර ප්‍රතිපාදන -පර්යේෂණ හා සංවර්ධන			3,877,794	1,725,202
භාණ්ඩාගාර ප්‍රතිපාදන මූලධන හා පුනරුත්ථාපන			32,353,484	19,752,740
			467,239,202	**418,310,000**
අනෙකුත් ආදායම්				
ආයෝජන පොලී	29	18	12,602,246	9,055,079
ණය පොලී			623,181	602,114
දේපල කුලී			3,894,654	1,897,400
විවිධ ආදායම්			7,711,903	5,358,424
ශිෂ්‍ය ලියාපදිංචි (අභ්‍යන්තර)			861,742	943,456
විභාග ගාස්තු ආදායම්-අභ්‍යන්තර සහ බාහිර			209,200	95,550
වත්කම් / තොග ඉවත්කිරීමේ ලාභය			-	23,622
ප්‍රකාශන සඟරා අලෙවි ආදායම්			21,030	6,360
විශේෂ අරමුදල් / පරිත්‍යාග ආදායම්			3,509,573	2,558,712
උපාධි උත්සව ආදායම්			2,919,500	33,500
දඩ මුදල් ආදායම්			41,405	125,823
ලිපි ද්‍රව්‍ය ආදායම්			1,212	849
ප්‍රවාහන ගාස්තු ආදායම්			1,162,085	799,621
			33,557,731	**21,500,510**
මෙහෙයුම් ආදායම්වල එකතුව			**500,796,933**	**439,810,510**
මෙහෙයුම් වියදම්				
පුද්ගල පඩිනඩි හා විශ්‍රාම ප්‍රතිලාභ	30	19	320,676,533	308,082,621
ගමන් වියදම්	30	20	6,264,653	4,212,103
සැපයුම්	30	21	14,898,988	11,468,452
අලුත්වැඩියා නඩත්තු කටයුතු	30	22	11,458,059	9,275,533
ගිවිසුම් ගත සේවා	30	23	62,725,718	42,134,579
පුහුණු හා සංවර්ධන වියදම්	31	24	879,856	871,228
ශිෂ්‍යාධාර	31	25	16,036,150	20,251,338
විවිධ පුනරාවර්තන වියදම්	31	26	11,017,872	6,713,297
තොග අගය ලියාහැරීම/ තොග සඳහා වෙන්කිරීම්			-	310
වත්කම් පරිත්‍යාග/ඉවත් කිරීමේ පාඩුව			1,148,972	112,755
පුනරාවර්තන ස්වභාවයේ වියදම්			252,000	1,552,058
පුනරුත්ථාපන ප්‍රතිපාදන යටතේ දරන ලද හැකියා වර්ධන වියදම්			40,000	80,000
පර්යේෂණ හා සංවර්ධන			5,077,794	3,725,202
දේපල, පරියත සහ උපකරණ ක්ෂය/ අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	31	27	140,913,191	128,924,993
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අලාභය			2,387,081	
මෙහෙයුම් වියදම්වල එකතුව			**593,776,867**	**537,404,469**
ඌණතාව			**(92,979,934)**	**(97,593,959)**
වෙනත් විස්තීර්ණ ආදායම				
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන ලාභය			23,652,399	-
පාරිතෝෂික දීමනා ගණනය මත ලාභය			13,723,491	-
			37,375,890	**-**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		2023 (රු.)	2022 නැවත ප්‍රකාශිත (රු.)
ක්‍රියාකාරී කටයුතුවලින් ලද මුදල්			
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ඌණතාවය		(92,979,934)	(97,593,959)
මුදල් සම්බන්ධ නොවන ගණුදෙනු			
ක්ෂය/ක්‍රමක්ෂය වීම්		140,913,191	128,924,994
පාරිතෝෂික		18,065,105	10,269,323
පොළී ආදායම්		(12,602,246)	(9,055,078)
දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේ අලාභය		1,148,972	112,755
දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේ අලාභය		2,387,081	(23,622)
තොග අගය ලියා හැරීම		-	310
පරිත්‍යාග		(3,520,237)	(2,558,712)
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමට පෙර ක්‍රියාකාරී ඌණතාවය/අතිරික්තය		**53,411,932**	**30,076,011**
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම.			
(වැඩි වීම)/ අඩු වීම	තොගය	(703,687)	(3,986,064)
(වැඩි වීම)/ අඩු වීම	ලැබිය යුතු ශේෂ	(3,008,998)	(5,127,454)
(වැඩි වීම)/ අඩු වීම	ඉදිරියට කළ ගෙවීම්	140,223	115,608
(වැඩි වීම)/ අඩු වීම	අත්තිකාරම් හා තැන්පතු	6,577,542	10,733,849
(වැඩි වීම)/ අඩු වීම	විවිධ ණය හිමියෝ	(12,393,202)	(702,569)
(වැඩි වීම)/ අඩු වීම	උපචිත වියදම්	2,982,281	1,603,530
(වැඩි වීම)/ අඩු වීම	රැඳවුම් හා ඇප තැන්පතු	(4,320,503)	(6,700,777)
නොනිමි බාහිර පාඨමාලා		2,497,324	12,603,535
පාරිතෝෂික ගෙවීම්		(8,768,203)	(3,934,711)
ක්‍රියාකාරී කටයුතුවලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(16,997,223)**	**4,604,947**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම		(11,375,191)	(3,151,098)
අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම		(145,000)	-
දේපල පිරියත හා උපකරණ විකිණීම		14,750	25,162
නව ආයෝජන		(10,410,657)	(35,567,100)
පොළී ආදායම්		13,407,327	4,135,252
ප්‍රාග්ධන පොළිය ප්‍රාග්ධනිත කිරීම		(15,974,428)	(4,161,343)
ස්ථාවර තැන්පතු ආපසු ගැනීම		21,925,979	30,745,075
නොනිමි වැඩ		(70,942,491)	(49,234,708)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**(73,499,711)**	**(57,208,760)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවහ			
භාණ්ඩාගාර ප්‍රතිපාදන (ප්‍රාග්ධන)		170,014,000	23,110,000
අනෙකුත් අරමුදල් ලැබීම්		-	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**170,014,000**	**23,110,000**
මුදල් හෝ මුදල් වලට සමාන දැහි වැඩිවීම		132,928,998	582,198
වර්ෂ ආරම්භක මුදල් හා මුදල් වලට සමාන දෑ වල එකතුව		21,792,712	21,210,514
වර්ෂ අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ වල වටිනාකම		**154,721,710**	**21,792,712**

වර්ෂ ආරම්භක මුදල් හා මුදල් වලට සමාන දෑ වල එකතුව

බැංකුවෙහි ඇති මුදල්	(10)	133,035,350	5,474,925
මාස තුනට අඩු ස්ථාවර තැන්පතු	(5.1)	21,686,360	16,317,787
		154,721,710	**21,792,712**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ
විසර්ජන ගිණුම් ප්‍රකාශය

විස්තරය	2023 (රු.)	2022 (රු.)
2023.01.01 දිනට ශේෂය	1,689,622,091	(336,384,356)
පසු ගිය කාලපරිච්ඡේදයට අදාළ ගැලපීම	-	2,122,234,869
වර්ෂයේ අනෙකුත් ගැලපීම	10,151,806	1,365,537
වර්ෂයේ ඌණතාව	(92,979,934)	(97,593,959)
2023.12.31 දිනට ශේෂය	**1,606,793,963**	**1,689,622,091**

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය	ප්‍රාග්ධන සංචිතය	වත්කම් ප්‍රත්‍යාගනන සංචිතය	පොදු සංචිතය	ගිවිසුම් කඩකළ ආචාර්යවරුන්ගේ සංචිත	වැය නොකල ප්‍රාග්ධන අරමුදල්	මුළු ස්කන්ධය
2021.12.31 දිනට ශේෂය - කලින් වාර්තා කළ	**1,525,341**	**28,507,469**	**(336,384,356)**	**9,232,925**	-	**(297,118,621)**
ගිණුම්කරණ ප්‍රමිත වෙනස් වීම මත බලපෑම (සටහන - 32)	-	-	2,122,234,869	-	-	2,122,234,869
ප්‍රත්‍යාගණනය කරන ලද ගොඩනැගිලි වලට අදාල ගැලපීම	-	(7,045,649)	-	-	-	(7,045,649)
රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව ගෙවිය යුතු මුදල ගැලපීම	-	(485,796)	-	-	-	(485,796)
පොළී ආදායම් ණය අරමුදලට, ත්‍යාග අරමුදලට මාරු කිරීම	-	-	(896,850)	435,984	-	(460,866)
පුස්තකාල පොත්	-	18,034,738	-	-	-	18,034,738
මෝටර් වාහන	-	59,855,667	-	-	-	59,855,667
වර්ෂය තුල ප්‍රාග්ධනිත කල වත්කම්	-	-	-	-	-	-
විශේෂ අරමුදල්/පරිත්‍යාග යටතේ පැවති වත්කම් හායනය	-	-	-	-	-	-
වෙනත්	-	-	2,262,387	1,500,000	-	3,762,387
වර්ෂයේ ඌනතාව	-	-	(97,593,959)	-	-	(97,593,959)
2022.12.31 දිනට ශේෂය - නැවත ප්‍රකාශිත	**1,525,341**	**98,866,429**	**1,689,622,091**	**11,168,909**	**-**	**1,801,182,770**
පොළී ආදායම් ණය අරමුදලට, ත්‍යාග අරමුදලට මාරු කිරීම	-	-	(11,546,534)	1,681,485	-	(9,865,049)
භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම් (ප්‍රාග්ධන)	-	-	-	-	125,914,798	125,914,798
වෙනත්	-	-	7,974,849	-	-	7,974,849
වෙනත් විස්තීර්ණ ආදායම	-	23,652,399	13,723,491	-	-	37,375,890
වර්ෂයේ ඌණතාවය	-	-	(92,979,934)	-	-	(92,979,934)
2023.12.31 දිනට ශේෂය	**1,525,341**	**122,518,828**	**1,606,793,963**	**12,850,394**	**125,914,798**	**1,869,603,324**

මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ සටහන්

1.1 සංස්ථාපිත තොරතුරු

1.1.1 වාර්තාකරණ ආයතන

